## උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය

## (1987 අංක 50 දරණ පනත යටතේ සංස්ථාගත කරන ලද)

# පුරප්පාඩු

උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලයේ පහත සඳහන් තනතුරු පුරප්පාඩුව පිරවීම සඳහා අදාළ සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 1. <u>පරිපාලන නිලධාරී II ශ්‍රේණිය</u> (තනතුරු 01)

**බාහිර අයදුම්කරුවන් (පහත සුදුසුකම් 1 හෝ 2)**

1. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පරිපාලන හා මානව සම්පත් කළමනාකරණ ක්ෂේත්‍රයට අදාළ උපාධියක් ලබා තිබීම.
2. පරිපාලන හා මානව සම්පත් කළමනාකරණ ක්ෂේත්‍රයට අදාළ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත්වීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත සුදුසුකම් 1 හෝ 2)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. ''කළමනාකරණ සහකාර තාක්ෂනික නොවන'' (MA 1-2) සේවා ගණයෙහි II වන ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස:-** අවු:22 ට නොඅඩු විය යුතු අතර 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.

**වැටුප් පරිමාණය:-** රු.42,600 – 10 x 755 – 18 x 1,135 – රු.70,580/=

(ඉහත සඳහන් වැටුපට අමතරව රජය විසින් අනුමත කර ඇති අනෙකුත් දීමනාද ගෙවනු ලැබේ.)

**පොදු කොන්දේසි**

අ. සෑම ඉල්ලුම්කරුවෙක්ම

I ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

II තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

III විශිෂ්ඨ චරිතයෙන් යුක්ත විය යුතුය.

ආ. මෙම තනතුර ස්ථිර තනතුරක් වන අතර විශ්‍රාම වැටුප් රහිතය.ස්ථාන මාරුවීම් නොමැත.

ඇ. සියලු අයදුම්කරුවන් කළමනාකරණ මණ්ඩලය මගින් තීරණය කරනු ලබන පරිදි ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට පසු තෝරා ගැනීම සිදු කෙරේ.

ඈ. සේ.අ.අ. සඳහා වැටුපෙන් 10% ක මුදලක් සේවා දායකයා විසින් ගෙවිය යුතු අතර, සේ.අ.අ. සඳහා 12% ක සහ සේ.නි.භා.අ. සඳහා 3% ක මුදලක් සේවායෝජකයා විසින් දායක මුදල් ලෙස ගෙවනු ලැබේ.

ඉ. තෝරා ගන්නා අයදුම්කරුවන්ට වෛද්‍ය, හදිසි අනතුරු රක්ෂණ පහසුකම් යනාදි ප්‍රතිලාභ හිමිවේ.

ඊ. ඉහත සුදුසුකම් සහ තනතුරට අදාළ පළපුරුද්ද සනාථ කෙරෙන සහතිකපත් වල සහතික කරන ලද ඡායා පිටපත් අමුණා අයදුම්පත සමඟ එවිය යුතුය. (සහතිකපත් වල ඡායා පිටපත් අමුණා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ)

ඉහත තොරතුරු ඇතුළත් අයදුම්කරු පිළිබඳව විමසිය හැකි ඥාතීන් නොවන පුද්ගලයන් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් සහ දුරකථන අංකයන් ඇතුළත් කරන ලද සම්පූර්ණ ජීව දත්ත සටහනක් ද සහිත අයදුම්පත් 2024.07.15 දින හෝ ඊට පෙර පහත ලිපිනයට ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම් පැත්තේ ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කර ලියාපදිංචි තැපෑලෙන් යොමු කරන්න.

ප්‍රධාන විධායක නිලධාරී / මාර්ෂල්
උපරිමාධිකරණ සංකීර්ණය
තැ.පෙ.223,
කොළඹ 12.